කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13

(නව/ පැරණි නිර්දේශය)

2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි

සමාජීය විද්‍යා පීඨය

සමාජ විද්‍යාව

ප්‍රායෝගික සමාජ විද්‍යාව - SOCI - E 1025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. ප්‍රායෝගික සමාජ විද්‍යාවේ ආරම්භය හා වර්ධනය සහ ප්‍රායෝගික සමාජ විද්‍යාඥයාගේ භූමිකාව ඔබ පැහැදිලි කරන්නේ කෙසේද ?

02. සංවර්ධන සංකල්පය පිළිබඳ නිර්වචනය කිරීමේදී මානව සංවර්ධන සංකල්පය වර්තමාන තුන්වන ලෝකයේ සංවර්ධන ක්‍රියාවලියේ යථාර්තය තේරුම් ගැනීම සඳහා වැදගත් වන ආකාරය ඔබ තක්සේරු කරන්නේ කෙසේද?

03. සමාජ වෙනස්වීම හැදෑරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු මොනවාදැයි පෙන්වා දෙමින් සමාජ වෙනස්වීම පිළිබඳ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද සමාජ විද්‍යාත්මක න්‍යායන් විග්‍රහ කරන්න.

04. ග්‍රාමීය සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

05. රටක ජනගහන ප්‍රවනතා අධ්‍යයනය කිරීමේ දී ජන සංක්‍රමණ න්‍යායේ ඇති වැදගත්කම ඔබ පැහැදිලි කරන්නේ කෙසේද?

06. 'රටක් සංවර්ධනය කරා ගමන් කිරීමේ දි එරට සමාජ සුබසාධක ප්‍රතිපත්ති ඉතා වැදගත්කමක් උසුලයි.' මෙම කියමන ශ්‍රී ලංකාවට විශේෂ අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

07. සමාජ ප්‍රශ්න හැදෑරීමේ දී වැදගත්වන ප්‍රධාන ප්‍රවේශ මොනවාදැයි යෝග්‍ය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

08. පහත සඳහන් ඕනෑම මාතෘකා <u>දෙකක් (02)</u> තෝරාගෙන සමාජ විද්‍යාත්මක සටහන් ලියන්න.
   1. ග්‍රාමීය දුගීභාවය පිළිබඳ සමාජ මාන
   2. තිරසාර සංවර්ධනය
   3. ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනයන් හි හේතු සහ ප්‍රතිඵල
   4. මානව කේන්ද්‍රනවාදය

*****************************